# රාජාලියාගේ ජීවන චක්‍රය



රනිදි කහඳවආරච්චි

# රාජාලියාගේ ජීවන චක්‍රය

රනිදි  කහඳවආරච්චි

කතෘ

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විදුහල ,මහනුවර.

5 ශ්‍රේණිය ඩී

2026-03-05

ISBN : 978-624-208-914-0

# පිදුම

මෙම පොත නිර්මාණය කිරීම සඳහා මා දිරිමත් කළ මාගේ පන්තිභාර ගුරුතුමිය වන ප්‍රමිතා වෙත්තසිංහ ගුරුමෑණියන්ට සෙනෙහසින් පිළිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයටදිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය.දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුවන් ලෙස දැයට දායද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී.එහි ප්‍රතිඵලයක් ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය වන, කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකරවූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන්ටත් ඔවුන්ට මගපෙන්වූ ගුරුහවතුන් ඇතුළු සැමටත් ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවුඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර,එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ.සිසු දරුවන්ගේ දක්ෂතා,නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව,සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි.එමෙන්ම,මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය,ගුරු මණ්ඩලය,සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශීර්වාදය පිරිනමමි.මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්.අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය,ශිෂ්‍ය දියණිවරුන්,සෙසු පාසල් වල දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්,අනිවාර්ය,ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහිකිරීමටත් කැපවී සිටී.එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව,විචාරශීලි චින්තනය ඇතුළු ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන් හේතු පාදක වේ.ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


1. හැඳින්වීම 1

2. කූඩු තැනීම 2

3. රාජාලි පවුල ගොඩනැගීම 3

4. රාජාලි පැටව් 4

5. පළමු පියෑඹීම 5

6. රාජාලි පැටවා ආහාර සොයා ගැනීම ආරම්භ කිරීම 6

7. රාජාලි පැටවා කූඩුව අතහැර යාම 7

8. නව පවුලක් ගොඩනැඟීම 8

9. රාජාලියාගේ වැදගත් ලක්ෂණ 9

10. රාජාලියෙක් නැවත ඉපදීම පිළිබඳ ජනප්‍රිය මිථ්‍යාකතාව 10

11. රාජාලියාගේ ජීවන චක්‍රයේ ඉදිරි අධ්‍යයනයන් හා යෝජනාවන් 12

# 1 හැඳින්වීම

තියුණු හොටක් හා නියපොතු සහිත දක්ෂ දඩයක්කාරයෙකු වන රාජාලියාගේ ජීවිතය උපතේ සිට පරික්ෂා කර බැලීම වැදගත් වේ.අනෙක් පක්ෂීන්ගෙන් වෙනස් වන විශේෂ ලක්ෂණ කිහිපයක්ම රාජාලියා සතුව තිබේ. රාජාලියා මෙතරම් දඩයමට දක්ෂ වන්නේ කෙසේද යන්න දැනගැනීමට රාජලියාගේ ජීවන චක්‍රය දෙස විමසිලිමත් වෙමු.



# 2 කූඩු තැනීම

අනෙකුත් සියලු පක්ෂීන් මෙන්ම රාජාලියා ද උපදින විට දෙමාපිය රැකවරණය අවශ්‍ය තත්ත්වයක සිටියි. රාජාලියා කූඩු සාදන විට, අනෙකුත් කුරුල්ලන් මෙන් එය සෑදීමට විශේෂයෙන් වෙහෙසීමක් නොකරයි. ස්වභාවිකව පිහිටා ඇති ගැළපෙන ස්ථානයක් රාජාලියා තමන්ගේ කූඩුව ලෙස තෝරා ගනී.ඉතා උස් තැනක් මේ සඳහා තෝරා ගනියි. මෙම කූඩුව අනෙකුත් පක්ෂීන්ගේ කූඩුවලට වඩා ප්‍රමාණයෙන් විශාලය.මේ සඳහා කෝටු කැබලි හා අනෙකුත් ශාකමය ද්‍රව්‍ය යොදා ගනී.



# 3 රාජාලි පවුල ගොඩනැගීම

ගැහැනු රාජාලියා වරකට බිත්තර 1 ක් 3 ක් අතර ප්‍රමාණයක් දමයි. බිත්තර රැකීම රාජාලියා හා ගැහැනු පක්ෂියා වරින් වර සිදු කරයි. බිත්තර උණුසුම්ව හා ආරක්ෂාකාරීව පවත්වාගෙන යනු ලබයි. පැටවුන් බිහිවන තෙක් දින 40 - 45 ක් අතර කාලයක් රැකීම සිදු වේ.



# 4 රාජාලි පැටව්

බිත්තරයෙන් එළියට එන රාජාලි පැටවා සම්පූර්ණයෙන්ම දෙමාපිය රැකවරණය මත යැපෙයි.මේ කාලයේදී රාජාලි පැටවාට තනිවම කිසිවක් කර ගත නොහැකිය.ඉපදී සති 6 ගතවන තුරු රාජාලි පැටියාගේ ඇස් පෙනීම හොඳින් සිදු නොවේ.නමුත් කටුවෙන් එළියට ආ විගසම පැටවාට ආහාර අවශ්‍ය වේ.මෙහිදී දෙමාපියන් විසින් පැටවාට ආහාර ලබාදෙනු ලැබේ.සති 9-10 දක්වා කාලයක් මෙලෙස දෙමාපියන් විසින් පැටවුන්ට ආහාර සැපයීම සිදු කරයි.



# 5 පළමු පියෑඹීම

සම්පූර්ණ මාස 3 ක කාලයක් රාජාලි පැටවා කූඩුව තුළ ජීවිතය ගත කරයි.මාස 3 කට පසු රාජාලි පැටවා පියඹා යාමට සූදානම් වෙයි.නමුත් පියෑඹීමට පෙර ශරීරය හා පියාපත් ක්‍රමවත්ව වායුගෝලයට හැසිරවීම සිදුකරන ආකාරය රාජාලි පැටවා ඉගෙනගත යුතුය.මෙය පුහුණු කරන්නේ දෙමාපියන් විසිනි.කූඩුවේ කෙළවරට පනින රාජාලි පැටියා නැවත කූඩුව තුළට ලිස්සා යයි.මේ මඟින් පැටියාට පුහුණුවක් ලැබේ.කූඩුවෙන් පිටතට පියඹා යාමට තරම් පුහුණුව  හා ධෛර්යය ලැබුණු පසුව ,කූඩුව අවට කෙටි පියඹුන් වාර පටන් ගනියි.ඇතැම් විට දෙමව්පියන්ද මේ සඳහා සහභාගී වේ.මෙහිදී දෙමාපියන් පැටවාට පෙනෙන ආකාරයට කරණම් ගැසීම හා වේගයෙන් පහළට පියඹා යාම සිදු කරයි.



# 6 රාජාලි පැටවා ආහාර සොයා ගැනීම ආරම්භ කිරීම

මාස 6 ක් යනතුරු පැටවාට ආහාර සපයා දීම දෙමාපියන් විසින් සිදු කරනු ලැබේ.මාස 6 කට පසු රාජාලි පැටියා දෙමාපියන් සමඟ ආහාර දඩයම් කරගැනීමට පුහුණු වෙයි.දඩයම් කිරීමට දෙමාපියන් සතු උපක්‍රම හා හැකියාවන් පැටියා වේගයෙන් පුහුණු වෙයි.තියුණු ඇස්,හොටය හා නියපොතු සාර්ථකව යොදාගන්නා ආකාරය දෙමාපියන් දෙස බලාගෙන ඉගෙන ගන්න පැටියා දක්ෂ දඩයක්කාරයෙකු බවට ක්‍රමයෙන් පත් වේ.



# 7 රාජාලි පැටවා කූඩුව අතහැර යාම

මෙය රාජාලි පැටවාගේ ජීවිතයේ වැදගත් පියවරක් ඉදිරියට තැබීමකි.පැටවා මෙතැන් පටන් නිදහස් ජීවිතයක් ගත කරයි.නමුත් සම්පූර්ණයෙන් දෙමාපියන්ගෙන් වෙන් වීමක් සිදු නොවේ.දෙමාපියන් හා සහෝදරයන් සමඟ සමීප සම්බන්ධතාවයක් පැටවා පවත්වාගෙන යයි.අවශ්‍ය විට එකිනෙකාට උදව් කර ගනිති.එක් අයෙකු හොඳ දඩයම් ස්ථානයක් සොයාගත් විට අනෙක් අයටත් ඒ බව දැනුම් දෙයි.ඔවුන්ටත් එතන දඩයම් කළ හැකිය.



# 8 නව පවුලක් ගොඩනැඟීම

එක් සහකරුවෙකු/සහකාරියක සමඟ පමණක් ජීවත් වන නිසා රාජාලි පැටවාට එය සොයා ගැනීම තීරණාත්මක අවස්ථාවකි.තම දක්ෂතාවයන් හා හැකියාවන් පෙන්වා සහකරුවෙකු සොයාගැනීම සිදු වේ.ඉන් පසුව දෙදෙනා එක්ව සුදුසු ස්ථානයක නව පවුල ගොඩනඟා ගැනීම සිදු කරති.



# 9 රාජාලියාගේ වැදගත් ලක්ෂණ

- රාජාලි වර්ග 60ක් පමණ ලෝකයේ විවිධ රටවල දැකිය හැකිය.
- විශාල බරක් එසවිය හැකි ශක්තිමත් පක්ෂියෙකි.
- වැඩුණු රාජාලියෙකු 4Kg පමණ බරය.
- දැස් ඉතා තියුණුය.
- ඉතා ඉහළ අහසේ පියාසර කරයි.
- මාළු හා කුඩා සතුන් ආහාරයට ගනියි.
- උස් ගස්වල හෝ පර්වථ වල කූඩු සාදයි.
- රාජලියා බුද්ධිමත් පක්ෂියෙකි.
- රාජලියාගේ  නියපොතු හා හොටය ඉතා තියුණුය.
- අවුරුදු 30ක් පමණ ජීවත් වේ.



# 10 රාජාලියෙක් නැවත ඉපදීම පිළිබඳ ජනප්‍රිය මිථ්‍යා කතාව

රාජාලියෙක් නැවත ඉපදීම පිළිබඳව ලොව පුරා ප්‍රචලිත වූ ජනප්‍රිය මිථ්‍යා කතාවක් තිබේ. එම කතාව අනුව, වයසක වූ රාජාලියා නව ජීවිතයක් ආරම්භ කිරීම සඳහා දුෂ්කර ක්‍රියාවලියක් හරහා ගමන් කරයි.

පළමු පියවර ලෙස, රාජාලියා ඉහළට පියාඹා ගොස් ගලක හප්පා තම හොට කඩා දමයි. ඉන් පසු අලුත් හොටක් වර්ධනය වන තෙක් නිරාහාරව සිටින බව කියවේ. නව හොට ලැබුණු පසු, එය භාවිතා කරමින් තම නියපොතු ගලවා දමයි. දින පනහක් හෝ පනස් පහක් පමණ ගත වූ පසු, අලුත් හා ශක්තිමත් නියපොතු යුගලයක් වර්ධනය වේ.

අවසානයේ, රාජාලියා තම පිහාටුද ගලවා දමයි. තවත් දින තිහක් හෝ තිස් පහක් පමණ කාලයක් ගත වූ විට, සම්පූර්ණයෙන්ම නව පිහාටු වර්ධනය වී, එය නැවත ශක්තිමත් රාජාලියෙකු බවට පත්වේ. මෙලෙස මාස පහක් පමණ දුක් විඳීමෙන් පසු, රාජාලියා අලුත් ජීවිතයක් ආරම්භ කරන බව මෙම කතාව කියා සිටී.

කෙසේ වෙතත්, මෙම කතාවට විද්‍යාත්මක සාක්ෂි නොමැති අතර, එය මිථ්‍යා විශ්වාසයක් ලෙස සැලකේ.

ඒත්, මෙම කතාවෙන් අපට ගත හැකි ආදර්ශය වැදගත්ය. කැපවීම, ඉවසීම සහ දුෂ්කරතා ඉවසමින් කටයුතු කිරීම මඟින් ජීවිතය නැවත ගොඩනගා ගත හැකි බව මෙය අපට සිහිපත් කරයි. අද ගන්නා තීරණයක ප්‍රතිඵලය අනාගතයේ විශාල වෙනසක් බවට පත්විය හැක. එම වෙනස සිදු කළ හැක්කේ ද තමාටම පමණි.



# 11 රාජාලියාගේ ජීවන චක්‍රයේ ඉදිරි අධ්‍යයනයන් හා යෝජනාවන්

- රාජාලි සංක්‍රමණ රටා අධ්‍යනය

  විවිධ රාජාලි විශේෂයන්ගේ සංක්‍රමණ රටා අධ්‍යනය කිරීම වැදගත් වේ.

  නව තාක්ෂණික ක්‍රමවේද ලෙස ජී.පී.එස් ලුහුබැඳීම් (GPS Tracking) තාක්ෂණය මේ සඳහා යොදා ගැනීමෙන් සංක්‍රමණ පථ සහ වාසස්ථාන පිලිබඳ දත්ත රැස්කල හැකිය.

- කාලගුණික විපර්යාස,රාජාලි වාසය සහ ගොදුරු කෙරෙහි බලපෑම අධ්‍යනය කිරීම.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික **පර්යේෂණ** ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයන්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කිරීමට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්නා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වේ.

පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්විමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමව්පියන්, ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ )

ISBN :978-624-208-914-0